සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 | S | I

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................................ නර්තනය - I කාලය : පැය 01යි.**

- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන කඩදාසියේ 1, 2, 3, 4 වලින් නිවැරදි පිළිතුරට ගැළපෙන අංකය මත (X) ලකුණ යොදන්න.**
- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු පිළිතුර තෝරන්න.**

---

01. 10 වැනි සරඹයේ සරඹ නාමය වන්නේ .......................... ය.
(1) බඹර සරඹ ය. (2) දූල සරඹ ය. (3) අංගහාර සරඹ ය. (4) චන්ද්‍රිකා සරඹ ය.

02. දේශීය නටුම් සම්ප්‍රදායන්ට පොදු වූ මූලික අංගහාරය වන්නේ ..........................
(1) සරඹ (2) පදය (3) මණ්ඩිය (4) අර මණ්ඩිය

03. ''පහළට එනකොට නිවිලයි එන්නේ මෙම ගායනය අයත් වන්නේ .......................... වලටය.
(1) චාමර කවි (2) ඔන්චිලි වාරම් කවි (3) ප්‍රශස්ති ගායනා (4) මල් යහන් කවි

04. ලන්තෑරුම සහ වංගෙඩිය .......................... නාටකයට අයත් රංග උපකරණ වේ.
(1) කෝලම් (2) නූර්ති (3) නාඩගම් (4) සොකරි

05. නර්තන විෂය හැදෑරීමේ දී තිත් තාල ක්‍රම ලියා දැක්වීම .......................... නම් වේ.
(1) ප්‍රස්තාරකරණය (2) තාල තැබීම (3) ගායනය (4) වාදනය

06. ග්‍රීක නාට්‍යයක් ඇසුරින් බන්දුල ජයවර්ධන මහතා නිර්මාණය කළ නාට්‍යයක් වනුයේ .......................... ය.
(1) තම්බපණ්ණි (2) කුවේනි (3) දෙපානෝ (4) බෙරහඬ


07. ශාන්ති කර්ම පැවැත්වීමේ දී ප්‍රථමයෙන් .......................... සිදු කරන්නේ මූලික චාරිත්‍රයක් ලෙසිනි.
(1) කප් සිටුවීම (2) මඩු පේ කිරීම (3) තොට පේ කිරීම (4) තොටමෙට යාම

08. මලබෙර වාදනයේ දී සුදු රෙදිකඩකින් ඔතා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩය .......................... වේ.
(1) ගැට බෙරය (2) දවුල (3) පහතරට බෙරය (4) උඩැක්කිය

09. උඩරට වන්නම් රචනා වූයේ .......................... යුගයේ ය.
(1) අනුරාධපුර (2) කෝට්ටේ (3) මහනුවර (4) ගම්පල

10. දොං ජිජිගත බෙර පදය වාදනය කරන වාදන භාණ්ඩය වන්නේ
(1) ගැටබෙරය - උඩැක්කිය (2) දවුල - පහතරට බෙරය
(3) ගැටබෙරය - යක්බෙරය (4) තම්මැට්ටම - උඩැක්කිය

- **අංක 11 - 21 තෙක් ප්‍රශ්න සඳහා ප්‍රෙහේලිකාව ඇසුරින් පිළිතුරු ලියන්න.**




**හරහට**

11. (01) උඩරට ගැමි නාටකයට අයත් ප්‍රධාන චරිතයකි.

12. (02) සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයකි.

13. (03) සොකරි නාටකය සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩයකි.

14. (04) ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස දවුල යොදා ගන්නා පළාතකි.

15. (05) සොකරි නාටකය අයත්වන සම්ප්‍රදාය මේ නමින් හැඳින්වේ.

16. (06) සොකරියගේ මෙහෙකාරිය හඳුන්වන නමකි.

17. (07) කවි ගායනාවේ සඳහන් පරිදි සොකරි සැරසී සිටින වස්ත්‍ර මෙනමින් හැඳින්වේ.

**පහලට**

18. (01) වෙදරාලගේ පුතා මෙනමින් හැඳින්වේ.

19. (06) ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර වාසය කළ ප්‍රදේශයයි.

20. (08) සොකරිය ගැමි නාටක සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩයයි.

21. (09) සොකරිය කරට පලඳින ආභරණයකි.

- **22 - 40 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

22. ''ගසමින් කගපතින් දෙපළුව අසුරසෙන්'' යන කවි පදය ඇතුළත් වන වන්නම වන්නේ,


(1) සැවුලා වන්නම (2) හනුමා වන්නම (3) වෛරෝඩි වන්නම (4) තුරඟා වන්නම

23. කොහොඹාකංකාරි ශාන්ති කර්මයේ එන පුරාවෘත්ත කථාවේ සඳහන් මලය රජුන් තිදෙනා ලෙස නම් කෙරෙන්නේ,

(1) ඉරුගල් බණ්ඩාර, කන්දෙ බණ්ඩාර (2) කිත්සිරි, සඳලිඳු, මලය

(3) විජය රජු, පඬුවස් දෙවි, මලය රජු (4) පඬි රජු, රාහු අසුරේන්ද්‍රයා, මලය රජු

● පහත රූප සටහන ආශ්‍රයෙන් 23 - 28 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



24. ඉහත රූප සටහනෙහි දැක්වෙන්නේ කුමන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩයක් ද?

(1) උඩරට (2) සබරගමු (3) පහතරට (4) ද්‍රවිඩ

25. ඉහත වාද්‍ය භාණ්ඩය හඳුන්වන නමකි.

(1) සොෂක බෙරය (2) මගුල් බෙරය (3) දවුල් බෙරය (4) ගැට බෙරය

26. මෙම බෙරයේ මුහුණතෙහි විෂ්කම්භය වන්නේ,

(1) අඟල් 10යි (2) රියනකි (3) අඟුලකි (4) එක් වියත් තුනඟුලකි

27. බෙරයේ වරපටි සඳහා යොදා ගන්නා හම් වර්ගය වන්නේ,

(1) මුව හම (2) හරක් හම (3) ගෝන හම (4) රිලා හම

28. ඉහත වාද්‍ය භාණ්ඩයේ බෙර ඇස සඳහා යොදා ගන්නා හම් වර්ගය වන්නේ,

(1) හරක් හම (2) ගෝන හම (3) හරක් බොක්ක (සිවිය) (4) මුව බොක්ක (සිවිය)

● නිවැරදි පිළිතුරට (29 - 40 දක්වා) යටින් ඉරක් අඳින්න.

29. දෙවොල් මඩු ශාන්ති කර්මයේ එන පුරාවෘත්ත කථාවේ සඳහන් රජතුමා ලෙස නම් කෙරෙන්නේ,

(1) සේරමාන් (2) දෙවොල් (3) මංගර (4) පත්තිනි

30. පහතරට වන්නම් ගණනින් මෙසේය.

(1) 28යි. (2) 32යි. (3) 24යි. (4) 18යි.

31. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඇති ආභරණ කීපයකි

(1) උල්උඩය, දෙවල්ල, රහුකුට්ටම් (2) සිඛා බන්ධනය, හගල, රතුරෙද්ද

(3) උල්උඩය, හගල, හැඩතල්ල (4) සිඛා බන්ධනය, තෝඩුපත්, පායින්පත්

32. රජවරුන්ට සෙමෙර සැලීම කාර්ය ඇසුරුකර ගනිමින් මෙම ගායනා නිර්මාණය වී ඇත.

(1) සවරං (2) චාමර (3) කළ (4) පන්තේරු

33. ගැමි නැටුමක ඇති සුවිශේෂ ලක්ෂණයකි.

(1) උපකරණයක් අතැතිව නර්තනයේ යෙදීම (2) ගායනය රහිත වීම.

(3) තනි තනිව නර්තනය කිරීම (4) ශාස්ත්‍රීය බව

34. කමත ආශ්‍රය කරගෙන නිර්මාණය වූ ගැමි නැටුම් වන්නේ,

(1) කළ සහ කුළු (2) කුළු සහ ගොයම් (3) ගොයම් සහ කළ (4) ගොයම් සහ චාමර

35. දුටුගැමුණු රජතුමා නලඟනන් 16,000ක් පිරිවරාගෙන රුවන්වැලිසෑය බඳින ස්ථානයට ගිය බව සඳහන් වන්නේ,

(1) මහා වංශය (2) ථූප වංශය (3) බෝධි වංශය (4) දේව වංශය

36. මහා පරාක්‍රමබාහු රජතුමා නැටුම්, ගැයුම්, වැයුම් සඳහා ඉදිකල මණ්ඩපය වන්නේ,

(1) නිශ්ශංකලතා මණ්ඩපය (2) රුවන්වැලි මණ්ඩපය
(3) සරස්වතී මණ්ඩපය (4) කැටපත් පවුර

37. ''මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ'' යන ගීතය කුමන වේදිකා නාට්‍යයේ ගීතයක් ද?

(2) බෙරහඬ (2) අන්දරේලා (3) විදුර (4) නරිබෑනා

38. රුංතක ජිංතක තරිකිට කුංදත් කස්තිරම දීර්ඝ ලෙස නර්තනය කරනුයේ,

(1) 8 වෙනි ගොඩ සරඹයටය. (2) 7 වෙනි සරඹයටය.
(3) 6 වෙනි සරඹයටය. (4) 8 වෙනි සරඹයටය.

39. වේදිකාව සඳහා නර්තනය නිර්මාණය කිරීමේ දී වඩාත් අවධානය යොමුකළ යුතු වන්නේ,

(1) බෙර වාදනය කෙරෙහිය (2) අවකාශ භාවිතය කෙරෙහිය
(3) ගායන ශිල්පීන් කෙරෙහිය (4) පසුතල නිර්මාණ කෙරෙහිය

40. 12 + 12 + 123 තිත් රූපය සඳහා තාලම්පට වාදනය කිරීමේ දී මෙවැනි හඬක් උපදී.

(1) තෙයි තෙයි තෙයි (2) තිත් තිත් තෙයි
(3) තෙයි, තෙයි, තිත් (4) තිත් තෙයි, තෙයි

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 S II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................................. නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය**

01. ගායනය හා වාදනය
    - (i) කැමති ගායනයක් කිරීම (ල. 05)
    - (ii) ඔන්චිලි වාරම් කවියක්/චාමර කවියක් ගායනය (ල. 05)
    - (iii) පරීක්ෂක මණ්ඩලය විසින් වාදනය කරනු ලබන බෙරපදය කීම හා බෙර පදයේ තාල රූප නම් කිරීම (ල. 05)
    - (iv) 8, 9, 10 ගොඩ සරඹ වලින් එක් සරඹයක් නර්තනය කර එහි කස්තිරම නර්තනය කිරීම. (ල. 05)

02. වන්නම් නර්තනය කිරීම.
    සැවුලා වන්නම නර්තනය කිරීම. ලකුණු 20යි

03. ඔබ කැමති වේදිකා නාට්‍ය ගීතයකට නර්තනයක් ලකුණු 20යි.

04. ගැමි නැටුම්
    චාමර නැටුමට අදාල මාත්‍රා 2ක් නර්තනය කරන්න. ලකුණු 20යි.

05. පහත දැක්වෙන සිද්ධිය විකාශනය කර ගනිමින් නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.
    මුහුදු ගිය තම පුතා එනතුරු මහළු මව බලා සිටී. පුතා පැමිණෙන්නේ නැත.
    චරිතය - මහළු කාන්තාව ලකුණු 20යි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

44 | S | II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................................ නර්තනය - II** **කාලය : පැය 02යි.**

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

01. (i) උඩරට වන්නමක කොටස් ................................................ කි.
(ii) දොං ජිංත ගත දොංත වට්ටම නටනු ලබන්නේ මාත්‍රා .......................................... තාලාරූපයටය.
(iii) කරදිය මුද්‍රා නාට්‍යයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ .................................................. මහතාය.
(iv) 12 වන ගොඩ සරඹය .......................................................... නමින් හැඳින්වේ.
(v) තත්, ජිත්, තොං, නං, යනු .......................................................... වේ.
(vi) ගුරුහාමි ලක්දිවට පැමිණීමට පෙර .......................................................... වාසය කළේය.
(vii) ඔංචිලි වාරම් ආසාතාත්මකව හා .......................................................... ගායනා කරයි.
(viii) සන්නිවේදන කාර්යයේ දී භාවිතා වූ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .......................................................... වේ.
(ix) ශාරීරික ස්වස්ථතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක
(1) .......................................................... (2) ..........................................................
(x) උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික සරඹ අභ්‍යාසයේ දී .......................................................... සහ .......................................................... වලදීය. (ල. 12යි)

02. (i) සැවුලා වන්නමේ බෙර පදය අදාළ තිතට ප්‍රස්තාර කරන්න. (ල. 4යි)
(ii) මාත්‍රා 4 + 4 තනි තිතට අයත් චාමර කවියක් ප්‍රස්තාර කරන්න. (ල. 4යි)
(iii) "ජෙන් තත් තා .................................. අඩව්ව මාත්‍රා 2 + 4 දෙතිතට ප්‍රස්තාර කරන්න. (ල. 4යි)

03. (i) දේශීය මුද්‍රා නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 4යි)
(ii) එයින් එක් නාට්‍යක කතා ප්‍රවෘත්තිය කෙටියෙන් ලියන්න. (ල. 4යි)
(iii) ඉහතින් විස්තර කල මුද්‍රා නාට්‍යයේ ......
(1) නිෂ්පාදනය
(2) රංගවස්ත්‍ර නිර්මාණය
(3) සංගීත නිර්මාණය
(4) එක් චරිතයක් ලියන්න. (ල. 4යි)

04. (i) සොකරි ගැමි නාටකය පවත්වන ප්‍රදේශ 4ක් නම් කරන්න.
(ii) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 4ක් ලියන්න.
(iii) සොකරියගේ චරිතයේ ගති ලක්ෂණ ගායනා ඇසුරින් විග්‍රහ කරන්න.

05. (i) නර්තන නිර්මාණය සඳහා යොදාගත හැකි ජීවන වෘත්තීන් 4ක් නම් කරන්න. (ල. 4යි)

(ii) වෘත්තීන් ඇසුරින් නර්තන නිර්මාණයේ දී ඔබ තෝරාගත් වෘත්තියට අදාළ උපකරණය බැගින් ලියන්න. (ල. 4යි)

(iii) වෘත්තීන් සම්බන්ධව නර්තන නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න. (ල. 4යි)

06. (i) අතීතයේ සන්නිවේදන කාර්ය අවස්ථා 3ක් යටතේ සිදු කෙරිණි. එම අවස්ථා 3 නම් කරන්න. (ල. 4යි)

(ii) දළදා මාලිගාවේ දෛනිකව කෙරෙන තේවා වාදනයේ දී සිදු කරනු ලබන අවස්ථා තුන නම් කරන්න. (ල. 4යි)

(iii) සමාජීය කටයුතු වලදී සන්නිවේදන සඳහා වාදනය යොදාගත් අවස්ථා පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 4යි)

07. (i) අංග රචනා කිරීමේ දී භාවිතා වන ක්‍රම 4ක් නම් කරන්න. (ල. 4යි)

(ii) අංග රචනා කිරීමේ දී යොදා ගන්නා ද්‍රව්‍ය 4ක් ලියන්න. (ල. 4යි)

(ii) නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත හැකි ශාරීරික කුසලතා පිළිබඳ අගයමින් කෙටි සටහනක් ලියන්න.

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

44 | S | I - II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (1) | 11. | සොකරි | 21. | මාල | 31. | (4) |
| 2. | (3) | 12. | වන්නි | 22. | (1) | 32. | (2) |
| 3. | (2) | 13. | තාලම්පට | 23. | (2) | 33. | (1) |
| 4. | (4) | 14. | ඌව | 24. | (3) | 34. | (2) |
| 5. | (1) | 15. | උඩරට | 25. | (1) | 35. | (1) |
| 6. | (4) | 16. | කාලි | 26. | (4) | 36. | (3) |
| 7. | (1) | 17. | සේල | 27. | (2) | 37. | (3) |
| 8. | (2) | 18. | සොත්තානා | 28. | (3) | 38. | (1) |
| 9. | (3) | 19. | කාසි | 29. | (1) | 39. | (2) |
| 10. | (1) | 20. | ගැටබෙරය | 30. | (2) | 40. | (2) |

මුළු ලකුණු - 40

### II කොටස

01. (i) 6කි (ii) 2 + 3 තාල රූපයටය (iii) අමරදේව, ලයනල් අල්ගම
(iv) චන්ද්‍රිකා සරඹය (v) සතර බීජාක්ෂර (vi) කාසි රට
(vii) අනාඝාතාත්මකව (viii) දවුල (ix) (1) කායික සාධක
(2) මානසික සාධක ල. 12

(x) (1) ගොඩ සරඹ (2) ඉලංගම් සරඹ

ලකුණු 1 × 4 = 04

02. (i) මාත්‍රා 2 + 4 දෙතතිට ප්‍රස්ථාර කර ඇත්නම්
නිවැරදිව වගුගත කර ඇත්නම් ල. 02
නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ල. 02
(ii) චාමර කවිය අදාල තිතට ප්‍රස්තාර කර ඇත්නම් ල. 04

(iii) නිවැරදිව සංකේතවලට හා වගුගත කිරීමට ල. 02
අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ල. 02

03. (i) කරදිය, කුඹී කතාව, නල දමයන්ති, සත් පත්තිනි ආදී වශයෙන් ලියා ඇත්නම් ල. 04
(ii) කුමන හෝ නාට්‍යයක කතා ප්‍රවෘත්තිය ලියා ඇත්නම්
(iii) **(1) කරදිය**
*චිත්‍රසේන මහතා
*සෝමබන්දු විද්‍යාපති
*අමරදේව

**(2) කුඹී කතාව**
*අංජලිකා චිත්‍රසේන මහත්මිය
*මහේෂ් උමගලීය
*රොබට් ජුලීන් හා පිරිස
එක් චරිතයක් ලියා ඇත්නම් ලකුණු 1 x 4 = 4

04. (i) * මාතලේ, කළුන්දෑව, වඩිගමංගාව, හගුරංකෙත, කොනකගල, ලග්ගල, තලාතුඹය..ආදී වශයෙන් 4ක් ලියා ඇත්නම් ල. 04
(ii) * ප්‍රජාර්ථ, විනෝදාර්ථය, සශ්‍රීකත්වය, ගමට රටට සෙත් පැතීම ... ආදී ලෙස ලියා ඇත්නම් ල. 04
(iii) අදාළ විස්තරය කවි ඇසුරින් විග්‍රහ කර ඇත්නම් ල. 04

05. (i) ධීවර, මැටි, පතල්, තේ, කොහු, කෘෂි, වශයෙන් 4ක් ලියා ඇත්නම් ල. 04
(ii) වෘත්තියට අදාළ උපකරණය බැගින් ලියා ඇත්නම් ල. 04
(iii) කරුණු 4ක් ලියා ඇත්නම් ල. 04

06. (i) (1) රාජ්‍ය පාලන කටයුතු (2) ආගමික කටයුතු (3) සාමාජීය කටයුතු (ල. 04)
(ii) (1) අළුයම් ධූරය (2) මැදියම් ධූරය (3) හැන්දෑ ධූරය (ල. 04)
(iii) විග්‍රහ කර ඇත්නම් (ල. 04)

07. (i) (1) ස්වභාවික (2) චරිතාංග (3)ශෛලිගත (4) විකාර රූපී ලෙස ලියා ඇත්නම් (ල. 04)
(ii) මූලික ආලේපන, තොල් ආලේපන, අයිෂැඩෝ රූච්, පින්සල්, ස්පොන්ච් ... ආදී 4ක් ලියා ඇත්නම් (ල. 04)
(iii) නිවැරදිව කරුණු සඳහන් කර ඇත්නම් (ල. 04)